සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයː |
|---|

<u>උපදෙස් :</u>

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු

---

- **අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.**

01 ඕසෝන් ස්තරය ........................................................ ගෝලයේ පිහිටා ඇත. (පරිවර්තී / අපරිවර්තී / මෙසෝ)

02 සාගරික කබොල .................................................. පාෂාණ වලින් සමන්විතය. (බැසෝල්ට් / ග්‍රැනයිට් / නයිස්)

03 පෘථිවි ශිලාගෝලය විශාල තැටි ................................................................ කින් සමන්විත වේ. (හය / හත / අට)

04 නයිල් ගඟ ......................................................... ආරම්භ වන ගංගාවකි. (උල්පතකින් / කඳුකරයෙන් / විලකින්)

05 ශ්‍රී ලංකාවේ ........................................................... දිස්ත්‍රික්කයේ වැඩිම බිම් ප්‍රමාණයක වී වගා කෙරේ. (අනුරාධපුර / පොළොන්නරුව / කුරුණෑගල)

06 ශ්‍රී ලංකා තේ මිලදී ගන්නා ප්‍රධාන රටක් ලෙස ........................................................... හැඳින්විය හැකිය. (ඉරානය / ජපානය / ඕස්ට්‍රේලියාව)

07 ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණ ආයතනය .............................. පිහිටුවා ඇත. (මිද්දෙනිය / තංගල්ල / ලුණුවිල)

08 ලොව වැඩිම යකඩ හා වානේ ප්‍රමාණයක් .......................................................... නිෂ්පාදනය කෙරේ. (ජපානයේ / රුසියාවේ / චීනයේ)

09 චර්නෝසම් පස වඩාත් යෝග්‍ය වන්නේ ............................................................ වගාවට ය. (උක් / කපු / තිරිඟු)

10 ශ්‍රී ලංකාවේ රතු දුඹුරු ලැටසෝල් පස ................................ වගාවට යෝග්‍ය වේ. (පළතුරු / එළවළු / තෘණ)

- **11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

11 පෘථිවියේ ඇති විශාල කඳු වැටි නිර්මාණය වී ඇත්තේ භූ චලන හට ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසය. (නි/වැ)

12 කැරිබියානු දූපත් ආශ්‍රිත වෙරළ කලාපය බහුලව සුනාමි බලපෑමට ගොදුරු වන ප්‍රදේශයකි. (නි/වැ)

13 ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය රාජ්‍ය අංශය යටතේ පවත්වාගෙන යනු ලබන කර්මාන්තයකි. (නි/වැ)

14 2012 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය 11% කි. (නි/වැ)

15 උතුරු ඇමෙරිකාවේ ටෙක්සාස් ප්‍රදේශය කපු වගාව සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. (නි/වැ)

- **16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉරමත ලියා දක්වන්න.**

16. ලෝකයේ සුළි සුළං උපදව ඇතිවන ප්‍රදේශ 'අ' තීරුවේ ද, ඒවා හඳුන්වන නම් 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරයට අනුව 'ආ' තීරය නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරයේ දී | A ටයිෆූන් |
| 2. නැගෙනහිර ආසියාතික වෙරළබඩ පැසිපික් සාගරයේ දී | B විලිවිලීස් |
| 3. උතුරු අත්ලාන්තික් සාගරයේ දී | C සයික්ලෝන් |
| 4. ඕස්ට්‍රේලියාවේ වයඹ දිග වෙරළ සමීපයේ ඉන්දියන් සාගරයේ දී | D හරිකේන් |

(1) ACBD (2) BADC (3) CADB (4) DCBA (.........)

17. 'අ' තීරුවේ දැක්වෙන මහද්වීප වල පිහිටි කඳු කිහිපයක් 'ආ' තීරුවෙහි දැක්වේ. 'අ' තීරුවෙහි මහද්වීප අනුපිළිවෙලට ගැලපෙන සේ 'ආ' තීරුව සකස් කළ විට නිවැරදිව ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. අප්‍රිකාව | A ඇපලේචියන් කඳු |
| 2. යුරෝපය | B මහාබාධක කඳු |
| 3. උතුරු ඇමෙරිකාව | C ඇල්ප්ස් කඳු |
| 4. ඕස්ට්‍රේලියාව | D ඇට්ලස් කඳු |

(1) ABDC (2) BADC (3) CABD (4) DCAB (.........)

The National E-Learning Portal for The General Education

18. ශ්‍රී ලංකාවේ වනාන්තර පද්ධති කිහිපයක් 'අ' තීරුවේ ද ඒවායෙහි වැවෙන ශාක වර්ග 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව සකස් කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. නිවර්තන තෙත් වනාන්තර | A අරළු, බුළු, නෙල්ලි |
| 2. කඳුකර වියළි කලාපීය වනාන්තර | B පලු, වීර, එරමිණියා |
| 3. කඳුකර තෙත් කලාපීය වනාන්තර | C හොර, කීන, ගොඩපර |
| 4. කටු පඳුරු හා ලඳු කැලෑ | D සපු, මිහිරිය, මොර |

(1) ACBD (2) BCAD (3) CADB (4) DBCA (.........)

19. ශ්‍රී ලංකාවේ බල ශක්ති මූලාශ්‍ර කිහිපයක් 'අ' තීරුවේ ද බලාගාර කිහිපයක් 'ආ' තීරයේ ද දැක්වේ. 'අ' තීරයේ අනුපිළිවෙලට 'ආ' තීරය නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. සුළං බලශක්තිය | A වික්ටෝරියා |
| 2. ජල විදුලි බලශක්තිය | B කෙරවලපිටිය |
| 3. තාප විදුලි බලශක්තිය | C බරුතකන්ද |
| 4. සූර්ය බලශක්තිය | D හම්බන්තොට |

(1) DABC (2) ADBC (3) CDBA (4) BADC (.........)

20. ශ්‍රී ලංකාවේ 1 : 50,000 සිතියම් පත්‍රයක අන්තර්ගත,

A භෞතික ලක්ෂණ B සංස්කෘතික ලක්ෂණ

C වටතීරුවේ ඉහළ කොටස D වට තීරුවේ පහළ කොටස

යන තොරතුරු පිළිවෙලින් නිරූපණය කරන පිළිතුර තෝරන්න.

(1) ජනාවාස, වනාන්තර, පරිමාණය, සිතියම් වර්ගය
(2) වනාන්තර, පරිමාණය, ජනාවාස, සිතියම් වර්ගය
(3) ජනාවාස, සිතියම් වර්ගය, වනාන්තර, පරිමාණය
(4) වනාන්තර, ජනාවාස, සිතියම් වර්ග, පරිමාණය

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21. වායුගෝලීය සංයුතියෙහි 79% ක පමණ ප්‍රතිශතයක් අඩංගු වායු වර්ගය වන්නේ ........................................ ය.


22. මහද්වීපික කබොල .............................................................................................. පාෂාණ වලින් සමන්විතය.

23. ලෝක ජන සංඛ්‍යාවෙන් අඩකට වැඩි කොටසක් වාසය කරන්නේ ........................................... මහද්වීපයේ ය.

24. ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාවට යොදා ගනු ලබන්නේ ........................................ දිස්ත්‍රික්කයේ ය.

25. 1 : 50,000 පරිමාණයට අනුව අඳින ලද ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියමක් මත සෙන්ටිමීටර 4 කින් දක්වෙන දුරක් සැබෑ භූමියෙහි කිලෝ මීටර ............................................................ ක දුරකට සමාන වේ.

- **ප්‍රශ්න අංක 26 සිට 28 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න.**





26. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණය පිහිටා ඇති දිස්ත්‍රික්කය දක්වෙන අක්ෂරය ........................................ ය.

27. ශ්‍රී ලංකාවේ කරදිය මසුන් බෝ කරන මධ්‍යස්ථානයක් පිහිටි දිස්ත්‍රික්කය දක්වෙන අක්ෂරය ........................................ ය.

28. තේ පර්යේෂණ ආයතනය පිහිටි දිස්ත්‍රික්කය ........................................ ය.

- **29 හා 30 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට දී ඇති ප්‍රස්තාරය යොදා ගන්න.**




3.3 ප්‍රස්තාරය - ජනසංඛ්‍යාව බිලියනයෙන් බිලියනය වර්ධනය වීමට ගත වී ඇති කාලය

මූලාශ්‍රය : *http://www.usfunds.com/media/images* 2014.12.06

29. වර්ෂ 1800 සිට 1930 දක්වා කාලය තුළ ලෝක ජන සංඛ්‍යාවට බිලියන එකක් එකතු වීම සඳහා ගත වූ කාලය වර්ෂ ............................................................ කි.

30. වර්ෂ 1950 සිට 1999 දක්වා කාලය තුළ ජන සංඛ්‍යාව බිලියන හය දක්වා වර්ධනය වීමට ගත වූ කාලය වර්ෂ ............................................................ කි.

- ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.

31. ජාතික උද්‍යාන, දැඩි ස්වභාවික රක්ෂිත, අභය භූමි හා වන රක්ෂිත යන වන ජීවී රක්ෂිත සඳහා නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) යාල, හග්ගල, වීරවිල, සිංහරාජය (2) සිංහරාජය, හග්ගල, යාල, වීරවිල
(3) වීරවිල, යාල, හග්ගල, සිංහරාජය (4) හග්ගල, වීරවිල, සිංහරාජය, යාල (.........)

32. ශ්‍රී ලංකාවේ පහත සඳහන් ඛනිජ වර්ග ව්‍යාප්තව ඇති ස්ථාන නිවැරදිව පිළිවෙළින් දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?

සිලිකා වැලි, ඇපටයිට්, ඉල්මනයිට්, සර්කොන්

(1) පුල්මුඩේ, මාරවිල, බලංගොඩ, එප්පාවල (2) එප්පාවල, පුල්මුඩේ, මාරවිල, බලංගොඩ
(3) බලංගොඩ, එප්පාවල, මාරවිල, පුල්මුඩේ (4) මාරවිල, එප්පාවල, පුල්මුඩේ, බලංගොඩ (.........)

33. සෑම වර්ෂයකම ජූනි 5 දින සමරනු ලබන්නේ පහත සඳහන් කවර සිද්ධියක් ද?

(1) ලෝක පරිසර දිනයයි. (2) ලෝක ජල දිනයයි.
(3) ලෝක පෘථිවි දිනයයි. (4) ලෝක ඕසෝන් දිනයයි. (.........)

34. ශ්‍රී ලංකාවේ සුළි සුළං වල බලපෑම බහුලව දක්නට ලැබෙන මාස දෙක වන්නේ,

(1) ජනවාරි සහ පෙබරවාරි ය. (2) මාර්තු සහ අප්‍රේල් ය.
(3) සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් ය. (4) ඔක්තෝම්බර් සහ නොවැම්බර් ය. (.........)

35. ජන සංඛ්‍යාව පිරමීඩයක පතුල පළල් වීම තුළින් පැහැදිලි වන්නේ,

(1) ළමා වයස් ජන සංඛ්‍යාව වැඩි වී ඇති බවයි. (2) ළමා වයස් ජන සංඛ්‍යාව අඩු වී ඇති බවයි.
(3) වියපත් ජන සංඛ්‍යාව අධික වී ඇති බවයි. (4) වියපත් ජන සංඛ්‍යාව හීන වී ඇති බවයි. (.........)

36. කඳු වැටියක මුදුන් දෙකක් අතර පිහිටි පහත් ප්‍රදේශය හඳුන්වනු ලබන්නේ,

(1) සානුවක් ලෙස ය. (2) තැන්නක් ලෙස ය.
(3) කපොල්ලක් ලෙස ය. (4) පහත් බිමක් ලෙස ය. (.........)

37. ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛ පෙළේ රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) බ්‍රිතාන්‍ය, ඉන්දියාව, ප්‍රංශය, ජපානය
(2) චීනය, ජපානය, දකුණු කොරියාව, ඉන්දියාව
(3) ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, බ්‍රිතාන්‍ය
(4) ප්‍රංශය, චීනය, බ්‍රිතාන්‍ය, ජපානය (.........)

38. ලෝකයේ උසම ස්ථානයක පිහිටි විල හා ප්‍රමාණයෙන් විශාලතම විල පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) අයර් විල හා සුපීරියර් විල (2) බයිකල් විල හා ලැඩෝගා විල
(3) සුපීරියර් විල හා ටිටිකාකා විල (4) ටිටිකාකා විල හා සුපීරියර් විල (.........)

39. ලෝකයේ තේ නිෂ්පාදනය අතින් ප්‍රමුඛ ස්ථානයක් හිමිකරගෙන ඇත්තේ,

(1) අප්‍රිකානු රටවල් ය. (2) ආසියානු රටවල් ය. (3) යුරෝපීය රටවල් ය. (4) ඇමෙරිකානු රටවල් ය. (.........)

40. ශ්‍රී ලංකාවේ උතුරු මැද, වයඹ හා දකුණු යන පළාත්වල පිහිටි වී පර්යේෂණායතන අනුපිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මහඉලුප්පල්ලම, බතලගොඩ, බෝඹුවල (2) බෝඹුවල, බතලගොඩ, මහඉලුප්පල්ලම
(3) බතලගොඩ, මහඉලුප්පල්ලම, බෝඹුවල (4) මහඉලුප්පල්ලම, බෝඹුවල, බතලගොඩ (.........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි. I ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි අ, ආ, ඉ කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි. II කොටසින් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

## I - කොටස

(01) (අ) ඔබවෙත සපයා ඇති 1 : 50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති පිටු අංක කඩදාසිය යොදාගන්න.)

අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සිතියමේ A අක්ෂරයෙන් පෙන්නුම් කෙරෙන භූ ලක්ෂණය කුමක් ද?

(නිම්නය / නෙරුව / බෑවුම)

(ii) B අක්ෂරයෙන් පෙන්නුම් කෙරෙන භූ ලක්ෂණය කුමක් ද? (සානුව / තැන්න / කපොල්ල)

(iii) ප්‍රධාන ගංගාව ආශ්‍රිතව දක්නට ලැබෙන ජලවහන රටාව කුමක් ද? (ශාඛීය / අරීය / ජාලාකාර)

(iv) සිතියමේ කළුපාට කඩ ඉරිවලින් දක්වා ඇත්තේ කුමක් ද? (ගුරු පාර / කරත්ත පාර / අඩි පාර)

(v) D අක්ෂරයෙන් දක්වා ඇති කොටු කර ඇති ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර කීයද?

(එකයි /දෙකයි / තුනයි)


(vi) සිතියමේ දකුණු මායිම සමීපයේ මංසන්ධිය ආශ්‍රිතව දක්නට ලැබෙන ජනාවාස වර්ගය කුමක් ද?

(vii) සිතියම් ප්‍රදේශයේ වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබෙන ව්‍යාපාරික භෝග වගාව කුමක් ද?

(viii) වයඹ කෙළවර දක්නට ලැබෙන පොදු සේවා සැපයෙන රාජ්‍ය ආයතනයක් නම් කරන්න.


(ix) ඊශාන කොටසේ දක්නට ලැබෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ගය කුමක් ද?

(x) පහත දක්වා ඇති හරස්කඩ හොඳින් අධ්‍යයනය කොට එය නිර්මාණය කර ඇත්තේ සිතියමේ දක්වා ඇති E - F සහ G - H යන රේඛා දෙකෙන් කුමන රේඛාවට අනුකූලව දැයි පිළිතුරු පත්‍රයේ ඊට නියමිත ස්ථානයෙහි සඳහන් කරන්න.




(ලකුණු 1 × 10 = 10)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සිතියමෙහි ලකුණු කොට ඇති A, B හා C යනු කඳු අතරින් ඇපිනයින් කඳු දැක්වෙන අක්ෂරය කුමක් ද?


(ii) සිතියමෙහි D, E, F යන ගංගා අතරින් නයිජර් ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H, J යන ගිනි කඳු අතරින් ක්‍රැකැටෝවා ගිනිකන්ද දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) සිතියමෙහි K, L, M යන රටවල් අතරින් තේ වගා කරන ප්‍රධාන රටක් වන කෙන්යාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) සිතියමේ P, Q, R අක්ෂරවලින් දැක්වෙන රටවල් අතරින් ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදිත රටක් වන ජපානය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල.05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(i) සිතියමෙහි A, B හා C වලින් දක්වා ඇති ස්ථාන අතරින් සංචාරක ආකර්ෂණීය ස්ථානයක් වන හික්කඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) සිතියමේ D, E, F යන ස්ථාන අතරින් බතලගොඩ වී පර්යේෂණ ආයතනය දැක්වෙන අක්ෂරය කුමක් ද?


(iii) සිතියමෙහි B, H, J යන දිස්ත්‍රික්ක අතරින් රබර් පර්යේෂණ ආයතනය පිහිටි කළුතර දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) සිතියමෙහි K, L, M යන ස්ථාන අතරින් ඉල්මනයිට් ඛනිජ නිධි පිහිටා ඇති ස්ථානයක් වන පුල්මුඩේ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) සිතියමේ P, Q, R යන දැඩි ස්වභාවික රක්ෂිත අතරින් හග්ගල රක්ෂිතයෙහි පිහිටීම දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල.05)

## II - කොටස

(02) පෘථිවියේ සංයුතිය අනුව කොටස් බෙදී ඇති ආකාරය යාබද රූපයේ දක්වේ.




(i) රූපයේ 'A' කොටසෙහි දක්නට ලැබෙන ගෝලයෙහි පිහිටි පෘථිවි පෘෂ්ඨයට ආසන්නයෙන් පිහිටි ස්තර දෙක පිළිවෙළින් නම් කරන්න. (ල.02)

(ii) (a) රූපයේ 'B' අක්ෂරයෙන් දක්වා ඇති කොටස නම් කරන්න. (ල.01)

(b) මෙම කොටසෙහි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) (a) රූපයේ 'C' අක්ෂරයෙන් දක්වා ඇති ගෝලය සඳහන් කරන්න. (ල.01)

(b) ජෛව ගෝලයේ සමතුලිතතාව බිඳවැටීම කෙරෙහි මිනිසාගෙන් එල්ලවන අහිතකර බලපෑම් දෙකක් නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ල.04)

(03) (i) (a) දකුණු ඇමෙරිකාවේ තිරිඟු වගා කරන ප්‍රධාන රටක් නම් කරන්න. (ල.01)

(b) යුරෝපයේ තිරිඟු වගා කරන ප්‍රධාන රටක් නම් කරන්න. (ල.01)

(ii) (a) ආසියාවෙන් බැහැර උතුරු ඇමෙරිකාවේ වී වගා කරන ප්‍රදේශයක් නම් කරන්න. (ල.01)

(b) වී වගාවට බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) (a) ලෝකයේ ව්‍යාපාරික කිරි පට්ටි පාලනය කෙරෙන දකුණු ආසියාතික රටක් නම් කරන්න. (ල.01)

(b) ලෝකයේ කිරි පට්ටි පාලනය හා සම්බන්ධ නව ප්‍රවණතා දෙකක් නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ල.04)

(04) (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ නැගීම කෙරෙහි බලපා ඇති ස්වාභාවික හේතු දෙකක් නම් කරන්න. (ල.02)

(ii) දේශගුණික වෙනස්වීම් නිසා ඇතිවන අහිතකර පාරිසරික බලපෑම් තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) දේශගුණික වෙනස්කම් කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ල.05)

(05) (i) රටක සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන ''මානුෂ සංවර්ධන දර්ශකයේ'' ඇතුළත් මූලික අංග දෙකක් නම් කරන්න. (ල.02)

(ii) (a) සාක් රටවල් අතරින් ඉහළම මානුෂ සංවර්ධනයක් සහිත රට කුමක් ද? (ල.01)

(b) තිරසාර සංවර්ධනයේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) (a) ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල.02)

(b) එම ක්‍රියාමාර්ග රටේ සංවර්ධනයට දායක වන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල.03)

(06) (i) (a) ශ්‍රී ලංකාවට බහුලව බලපාන භූ විද්‍යාත්මක උපද්‍රවයක් හා,

(b) දේශගුණික උපද්‍රවයක් නම් කරන්න. (ල.02)

(ii) (a) භූ චලන හා භූමි කම්පා අතර වෙනස හඳුන්වන්න. (ල.01)

(b) භූමි කම්පා ඇතිවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) (a) අකුණු සැර මඟින් සිදුවන ආපදාවෙන් වැළකීම සඳහා නිවාස ඉදි කිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල.02)

(b) ආපදා කළමනාකරණ චක්‍රයේ අවස්ථා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.03)

(07) (i) ලෝකයේ ජනාධික කලාප දෙකක් නම් කරන්න. (ල.02)

(ii) (a) අප්‍රිකාවේ ජනහීන ප්‍රදේශයක් නම් කරන්න. (ල.01)

(b) ලෝක ජන සංඛ්‍යාවේ අවම ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති මානුෂ සාධක දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) (a) ශ්‍රී ලංකා ජන සංඛ්‍යා වර්ධනය ආශ්‍රිත ප්‍රාදේශීය වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල.02)

(b) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වියපත්වීම නිසා ඇති වන සමාජ ගැටලු දෙකක් පැහැදිලි කරන්න. (ල.03)

(08) (i) (a) සිලිකා වැලි

(b) පිඟන් මැටි (කෙඔලින්)

ඉහත ඛනිජ වර්ග දෙක ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් නිධිගත වී ඇති ප්‍රදේශ එක බැගින් පිළිවෙළින් සඳහන් කරන්න. (ල.02)

(ii) (a) චීනයේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයක් සඳහන් කරන්න. (ල.01)

(b) චීනයේ යකඩ හා වානේ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) (a) ආසියාවේ ප්‍රධාන නැව් නිෂ්පාදන රටක් නම් කරන්න. (ල.01)

(b) ලොව නැව් තැනීමේ කර්මාන්තයෙහි නව ප්‍රවණතා දෙකක් පැහැදිලි කරන්න. (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | අපරිවර්තී | 11 | නි | 21 | නයිට්‍රජන් | 31 | (1) |
| 02 | බැසෝල්ට් | 12 | නි | 22 | ග්‍රැනයිට් | 32 | (4) |
| 03 | හත | 13 | වැ | 23 | ආසියා | 33 | (1) |
| 04 | විලකින් | 14 | වැ | 24 | නුවරඑළිය | 34 | (4) |
| 05 | කුරුණෑගල | 15 | නි | 25 | දෙක | 35 | (1) |
| 06 | ඉරානය | 16 | (3) | 26 | E | 36 | (3) |
| 07 | ලුණුවිල | 17 | (4) | 27 | D | 37 | (2) |
| 08 | චීනයේ | 18 | (3) | 28 | B | 38 | (4) |
| 09 | තිරිඟු | 19 | (1) | 29 | 123 | 39 | (2) |
| 10 | පලතුරු | 20 | (4) | 30 | 12 | 40 | (1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

## II කොටස

(01) (අ) (i) නිම්නය (ii) කපොල්ල (ii) ජාලාකාර (iv) අධිපාර

(v) එකයි (vi) පොකුරු ජනාවාස (vii) රබර් (viii) පාසල (ල. 10)

(ix) වනාන්තර (x) E - F

(ආ) (i) C (ii) E (ii) G (iv) K (v) R (ල.05)

(ඉ) (i) C (ii) E (ii) J (iv) M (v) Q (ල.05)

(02) (i) (1) පරිවර්තී ගෝලය (2) අපරිවර්තී ගෝලය (ල.02)

(ii) (a) ජල ගෝලය (ල. 01) (b) කෘෂි කාර්මික කටයුතු සඳහා / කර්මාන්ත / ප්‍රවාහන කටයුතු (ල.02)

(iii) (a) ශිලා ගෝලය (ල.01)

(b) ● වනාන්තර විනාශ කිරීම නිසා පස විනාශ වීම / නිසරු වීම. ● ජලයට අපද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය මිශ්‍ර වීමෙන් ජලජීවීන් විනාශ වීම, කොරල්පර විනාශ වීම, මත්ස්‍යයන් විනාශ වීම. ● කෘමි නාශක, වල්නාශක භාවිතය නිසා ජීවීන් හා පසේ සංයුතිය වෙනස් වීම. ● වායු දූෂණය නිසා ජෛව පද්ධති විනාශ වීම හෝර්ටන් තැන්නේ වනාන්තර. ● කාබන්, නයිට්‍රජන්, ඔක්සිජන් චක්‍ර වලට බාධා (කරුණු 01 × 02 + පැහැදිලි කිරීමට ලකුණු 01 × 02 = ලකුණු 04)

(03) (i) (a) ආර්ජන්ටිනාව (ල.01) (b) ප්‍රංශය / තුර්කිය (ල.01)

(ii) (a) මිසිසිපි නිම්නය / සැක්‍රමැන්ටෝ නිම්නය (ල.01)

(b) ● උෂ්ණත්වය $27^0$C පමණ ● වර්ෂාපතනය 2000mm පමණ ● දියළු පස/තැනිතලා හෝ රැළි බිම් (ල.1×2)

(iii) (a) ඉන්දියාව / පකිස්ථානය

(b) ● නව තාක්ෂණික ක්‍රම / ශිල්ප ක්‍රම මගින් කිරි ලබා ගැනීම. කිරිදෙනුන්ට හෝර්මෝන / එන්නත් ලබා දීම. ● නිෂ්පාදනය සඳහා වෙළඳ පල පුළුල් වීම. (කරුණු දෙකකට ල. 02, පැහැදිලි කිරීමට ල. 02 = ලකුණු 04)

(04) (i) ගිනිකඳු පිපිරීම / ලැව්ගිනි / සූර්‍යලප (ල.02)

(ii) ● ස්වභාවික ආපදා වැඩිවීම. ● වර්ෂාපතන රටාවල වෙනස්කම් ● ලෙඩ රෝග බහුලවීම (ල.1×3=3)

(iii) ● හරිතාගාර වායු වර්ග පිට කරන බල ශක්ති ප්‍රභව අඩුවෙන් පරිහරණය කිරීම. ● භෝග වගාව සඳහා රසායනික පොහොර භාවිතය වෙනුවට ඓන්ද්‍රිය පොහොර භාවිතය. ● ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ● වතු වගා ව්‍යාප්ති ● මිශ්‍ර බෝග බහු වගා හඳුන්වා දීම. (ක්‍රියා මාර්ග 2 1×2, පැහැදිලි කිරීම 1.5×2 = 3 = (ල.05)

(05) (i) උපතේදී ආයු අපේක්ෂාව / සාක්ෂරතාව / ක්‍රය ශක්තිය (ල.1×2)

(ii) (a) ශ්‍රී ලංකාව (ල.01)

(b) පරිසර කළමනාකරණය / සංවර්ධන කළමණාකරණය (ල.1×2)

(iii) (a) ජනසවිය / සමෘද්ධිය / දිවිනැගුම / ප්‍රජා මූල සෞඛ්‍ය වැඩ සටහන් (දෙකකට ල.1×2)

(b) ක්‍රියාමාර්ග දෙක පැහැදිලි කිරීම (ල.1½ ×2=3)

(06) (i) (a) නායයාම් (ල.01) (b) ජලගැලීම් (ල.01)

(ii) (a) ● පාෂාණ ස්තර චලනය වන බව, ඒවා භූචලන වේ. ● ක්‍ෂණික විනාශකාරී ප්‍රතිඵල අත්කර දීම භූමි කම්පා වේ. (ල.01)

(b) ● භූ තැටි ගැටීම නිසා සිදුවන චලන ● යමහල් ක්‍රියාවලියකදී හෝ විභේද ක්‍රියාවලීන් නිසා (ල.02)

(iii) (a) ● විද්‍යුත් පරිපථ සම්බන්ධ කර භූගත කම්බි යෙදීම. ● නිවසේ විදුලි සැපයුමට පැන්නුම් ස්විචය ඇතුළත් කිරීම (ල.1×2)

(b) ● පෙර සූදානම ● ප්‍රතිචාර දැක්වීම ● යථා තත්ත්වයට පත් කිරීම ● ආපදා අවම කිරීම (අවස්ථා දැක්වීමට ලකුණු 1½, පැහැදිලි කිරීමට ල. 1½ = 03)

(07) (i) නැගෙනහිර ආසියාව / දකුණු හා අග්නි දිග ආසියාව / වයඹ දිග යුරෝපය / ඇමෙරිකාවේ ඊසාන දිග වෙරළබඩ (මින් දෙකක් නම් කිරීමට ල.1×2)

(ii) (a) කොංගෝ වනාන්තරය (ල.01)

(b) නාගරීකරණය / කර්මාන්ත ස්ථානගත වීම / වරාය / ගුවන් තොටුපල / පරිපාලන කටයුතු (සාධක 2, ල.1×2)

(iii) (a) ● වියළි කලාපයේ දිස්ත්‍රික්කවල වර්ධනය වැඩි බව. තෙත් කලාපයට සාපේක්ෂව (නිදසුන අනුරපුරය 1.33 / කොළඹ 0.35) ● කළුතර, ගම්පහ වර්ධනය ඉහළයි. හේතුව ජන සංක්‍රමණ. (ල.1×2)

(b) ● සුබ සාධන ගැටළුව ● රැකබලා ගැනීමේ ගැටළුව ● සෞඛ්‍ය ගැටළු ● සදාචාර ගැටළු (ගැටලු දැක්වීමට ½× 2 = 1, පැහැදිලි කිරීම 1×2=2)

(08) (i) (a) සිලිකා මාරවිල, නාත්තන්ඩිය, හලාවත, අම්පාර, වල්ලිපුරම් (මින් එකක් ල.01)

(b) පිඟන් මැටි බොරලැස්ගමුව, මීටියාගොඩ, රත්තොට (මින් එකක් ල.01)

(ii) (a) ● දකුණු මැන්චූරියා ප්‍රදේශය ● බීජිං ප්‍රදේශය ● ෂන් ෂුවාං ප්‍රදේශය (මින් එකක් ල.01)

(b) ● නිෂ්පාදන නවීකරණය වීම. ● නව වෙළෙඳපොළක් නිර්මාණය වීම. ● ප්‍රාග්ධනය, වෙළඳපල මත කර්මාන්ත ස්ථානගත වීම. ● ගල් අඟුරු වෙනුවට විකල්ප බල ශක්ති යොදා ගැනීම. (මින් දෙකක් ල.1×2)

(iii) (a) ජපානය / දකුණු කොරියාව (ල.1×1)

(b) ● එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වීම. ● සැහැල්ලු ලෝහ යොදා ගැනීම. ● සුවිශේෂී යාත්‍රා නිෂ්පාදනය කිරීම. ● අති විශාල අධි සුඛෝපභෝගී නැව්. ● විවිධ කාර්යයන් සඳහා නැව් (යුධ. ගවේෂණ, ධීවර, මගී) (ප්‍රවණතා 2 ල.1×2, පැහැදිලි කිරීම ල.1×2 = 04)